## විධිමත් සංක්‍රමණය ප්‍රචලිත කිරීම සඳහා වූ IOM ක්‍රියාකාරකම්

- ප්‍රජාවන්, ප්‍රජා නායකයින්, සිසුන් හා බහුදින යාත්‍රා හිමිකරුවන් සඳහා විධිමත් සංක්‍රමණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ස්ව කැමැත්තෙන් ආපසු පැමිණෙන්නන්ට සහය වීම හා ඔවුන්ව සමාජයට නැවත අනුකලනය කිරීම
  - ★ තාවකාලික ගමන් බලපත්‍ර සපයා දීම
  - ★ ගමන් ආරක්ෂාව
  - ★ ගුවන් තොටුපලේදී පිළිගැනීම
  - ★ සමාජයට අනුකලනය වීමට අවශ්‍ය සහය ලබා දීම (මුල්‍ය හෝ ද්‍රව්‍යමය)
  - ★ වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය කිරීම
- සංක්‍රමණයවන්නන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- සංක්‍රමණිකයන්ට පිටත්වීමේ පහසුකම් සැපයීම.
- කැනඩාව, නෙදර්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- නවසීලන්තයට සංක්‍රමණය වීමට ඉල්ලුම් කර ඇති අයගේ ලිපි ලේඛණවල නිර්වද්‍යතාවය සහතික කිරීම.
- තැනැත්තන් වෙළඳාම හා සම්බන්ධ වැරදිරුවන් හඳුනා ගැනීමට, විමර්ශනය කිරීමට හා චෝදනා ගොනු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ශ්‍රී ලංකා රජයට ලබා දීම.

## විධිමත් සංක්‍රමණය පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ස්ථාන

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

1989
011 288 0500

**නීති විරෝධි මිනිස් ජාවාරම් වැළැක්වීමේ පොලිස් විමර්ශන කාර්යාංශය**

ගුවනින්: 011 - 239 2917

මුහුදු මඟින්: 011 - 232 0141-4

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

011 - 277 8911

**සෘජු ඇමතුම් ළමාරක්ෂණ**

1929

**සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM)**

011 - 532 5362

077 441 0086

## වැඩි විස්තර සඳහා

International Organization for Migration (IOM)
සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM)
புலம்பெயர்தலுக்கான சர்வதேச அமைப்பு (IOM)

62, ආනන්ද කුමාරස්වාමි මාවත (ග්‍රීන් පාත්),
කොළඹ 03.

**ප්‍රධාන කාර්යාලය**
දුරකථන අංකය : 011 532 5362
ෆැක්ස් අංකය : 011 532 5307

**යාපනය කාර්යාලය**
දුරකථන අංකය : 021 222 8620
ෆැක්ස් අංකය : 021 222 9681

**වව්නියා කාර්යාලය**
දුරකථන අංකය : 024 222 4661
ෆැක්ස් අංකය : 024 222 0579

**කිලිනොච්චි කාර්යාලය**
දුරකථන අංකය : 024 324 4949
ෆැක්ස් අංකය : 021 228 5386

**මඩකලපුව කාර්යාලය**
දුරකථන අංකය : 065 5673400/02
ෆැක්ස් අංකය : 065 222 6968

අරමුදල් සපයන්නෝ

Australian Government
Department of Immigration and Border Protection

Immigration, Refugees and Citizenship Canada

# ඔබ විධිමත් සංක්‍රමණය පිළිබඳව දන්නේද ?

**එය ඔබව අන්තරාදායක තත්වයන්ට ගොදුරුවීම වළක්වයි.**



**වෙනත් රටකට ඔබ අවිධිමත් ලෙස සංක්‍රමණය වීමට බලාපොරොත්තු වන්නේද?**

**පනින්න පෙර සිතා බලනු!**

**ඔබ පිටරටකට සංක්‍රමණය වනුයේ රැකියාවකට හෝ වෙනත් කාරණයකට විය හැක. ඔබ ඒ සඳහා අවිධිමත් සංක්‍රමණය තෝරා ගන්නේ නම්,**

### ඔබේ ජීවිතය අවදානමකට ලක්විය හැක



### ඔබේ ප්‍රියයන් හා වත්කම් අහිමි වී යා හැක




### විරැකියාව නිසා දිගු කාලීන ආර්ථික අපහසුතාවයන්ට පත්විය හැක




### ඔබේ පවුලේ සාමාජිකයන් පීඩාවට පත්විය හැක



### සිහින බොඳ වී යා හැක



### ඔබව වසංගත රෝගයන්ට ගොදුරුවිය හැක



### ඔබ සිරගත වීමට ද ඉඩ ඇත



## ඔබ රැකියාවක් සඳහා විදෙස්ගත වන්නේද?

1. ඔබ සංක්‍රමණය වීමට බලාපොරොත්තුවන රටෙහිදී රැකියාවක් කිරීමට අවශ්‍ය වන කුසලතා ඔබ සතු විය යුතුයි.
2. පිටත්වීමට පෙර ඔබ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විය යුතුය. මේ තුළින් ඔබව සෞඛ්‍ය රක්ෂණයකට සහ වෙනත් ප්‍රතිලාභ වලට හිමිකම් ලැබෙනු ඇත.
3. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විදේශ රැකියා නියෝජිතයෙකු පමණක් තෝරා ගන්න.
4. හොඳින් කියවා බලා තේරුම් ගෙන පමණක් රැකියා ගිවිසුම අත්සන් කරන්න.
5. ඔබට අවශ්‍ය ඖෂධ පිටත්වීමට පෙර ඔබේ වෛද්‍යවරයාගෙන් ලබා ගෙන, රැගෙන යන්න.
6. ඔබගේ ගමන් බලපත්‍රයේ, රැකියා ගිවිසුමේ, අනෙකුත් අනන්‍යතා ලිපි ලේඛණවල පිටපත් ඔබගේ පවුලේ ඥාතීන් වෙත තබා යන්න. එය යම්කිසි ආපදා තත්වයකදී භාවිත කිරීමට ඉවහල් වනු ඇත.
7. ඔබ යන රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පිළිබඳ තොරතුරු ගැන දැනුවත්වීම යම් ආපදාවක දී ප්‍රයෝජනයට ගැනීමට ඉවහල් වනු ඇත.
8. ඔබ රටෙන් පිටත්වීමට පෙර ඔබගේ පවුලේ (භාර්යාව, දරුවන් හා දෙමව්පියන්ගේ) ආරක්ෂාව තහවුරු කර යන්න. එමෙන්ම ඔවුන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපන කටයුතු පිළිබඳවද රැකවරණයක් සලසන්න.